D

# නිවේදනය

වර්තමානයේ රටේ පවතින තත්ත්වය පිළිබඳ විශේෂ සැලකිල්ලට ගෙන පාර්ලිමේන්තුව වෙත වාර්ෂික වාර්තා, කාර්ය සාධන වාර්තා ඇතුලු අනෙකුත් වාර්තා ඉදිරිපත් කිරීමේදී ඒවා මෘදු පිටපත් (Soft Copies) මාර්ගයෙන් ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය 2022.06.02 දින පවත්වන ලද පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේ දී දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන ලද බව මෙම ගරු සභාවට දැනුම්දීමට කැමැත්තෙමි.

මේ වනවිට මුද්‍රිත කටයුතු සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සපයාගැනීමේ දී පවතින දුෂ්කරතාවය, එලෙසම ආනයනික සංයුක්ත තැටි වෙෙළඳපොළෙන් සොයාගැනීමට ඇති අපහසුතාවය සහ ඒ සඳහා ඉතා අධික මිලක් දැරීමට සිදුවීම, එලෙසම සංයුක්ත තැටි ප්‍රතිචක්‍රීකරණයේ දී පරිසරයට මුදා හැරීමේ දී ඇතිවන අහිතකර පාරිසරික බලපෑම් පිළිබඳව කාරක සභාවේ විශේෂ අවධානය යොමු කරන ලද බව සඳහන් කරමි.

තවද මේ වනවිට සියලුම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තාක්ෂණික මෙවලම් භාවිත කරන බැවින් සහ රාජ්‍ය සේවය ඩිජිටල්කරණය කිරීම මඟින් තිරසර ඊ-රාජ්‍ය සේවයක් ඇතිකිරීමේ කාලෝචිතභාවය පිළිබඳ සළකා බැලූ කාරක සභාව, වාර්ෂික වාර්තා හා ඊට අදාළ අනෙකුත් වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සම්බන්ධ වහාම ක්‍රියාත්මක වන පරිදි මතු දැක්වෙන ක්‍රියාමාර්ග ගැනීමට තීරණය කරන ලද බව දැනුම්දීමට කැමැත්තෙමි.

- මින් ඉදිරියට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන වාර්ෂික වාර්තා, කාර්ය සාධන වාර්තා ඇතුලු ඊට අදාළ අනෙකුත් වාර්තා සම්බන්ධ කටයුතු කිරීමට නිලධාරියකු පත්කොට අදාළ දිනවල දී සභාගත කරනු ලබන එකී වාර්තාවල මෘදු පිටපත් ගරු මන්ත්‍රීවරුන් වෙත ඊමේල් කිරීම.
- එලෙසම පාර්ලිමේන්තු වෙබ් අඩවිය හරහා දෛනිකව සභාගත කරනු ලබන වාර්තා ලැප්ටොප් පරිගණක හා ටැබ් හෝ ජංගම දුරකථන මඟින් පරිශීලනය කිරීමට හැකිවනු පිණිස මෘදු පිටපත් පාර්ලිමේන්තු වෙබ් අඩවියේ විශේෂිත වෙබ් පෝටලයකට (web portal) ඇතුළත් කිරීම.
- පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන එකී වාර්තාවල දෘඩ පිටපත් කිහිපයක් අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන කාරක සභාවල පරිශීලනය කිරීමට හා පුස්තකාලයේ තැබීමට කටයුතු කිරීම.

ඒ අනුව මේ සම්බන්ධව සියලුම අමාත්‍යාංශවල ලේකම්වරුන් දැනුවත් කොට එම වැඩපිළිවෙළ කඩිනමින් ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලදී.
රටේ දැනට පවතින දැඩි ආර්ථික අර්බුදකාරී තත්ත්වය පිළිබඳ විශේෂ අවධානය යොමුකොට වියදම් සීමා කිරීමේ පියවරක් ලෙස මෙන්ම, ඇතිවිය හැකි පාරිසරික ගැටලු ද අවම කිරීමේ අරමුණින් ගන්නා ලද මෙම ක්‍රියාමාර්ග සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගෙන් ලැබෙන සහාය බෙහෙවින් අගය කරමි.